# පසුගිය දශක දෙක තුළ ශ්‍රී ලංකා රජය අනුගමනය කරන ලද සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ ඇගයීමක්

එච්.ඒ.ටී. හෙට්ටිආරච්චි*

**සංක්ෂේපය**

දශක දෙකක කාලයක් තුළ ශ්‍රී ලංකා ආර්ථිකය විවිධ ආකාරයේ වෙනස්වීම්වලට භාජනය වී ඇති අතර එම වෙනස් වීම් උදෙසා රජය අනුගමනය කර ඇති ක්‍රියාමාර්ගයන් ද විවිධ ය. වර්ෂ 1977 න් පසුව ශ්‍රී ලංකා රජය විවෘත ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කර තිබේ. එතැන් පටන් අද දක්වාම ක්‍රියාත්මක වන්නේ විවෘත ආර්ථික ප්‍රතිපත්තීන් ය. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ සැලකිළිමත් වීමේදී සමස්ථයක් ලෙස එය ආර්ථික මෙහෙයුම සමග සම්බන්ධ වේ. ඒ අනුව 1994-2014 කාලසීමාව තුළ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ඇගයීම වඩාත් උචිත වනු ඇත. මන්ද යත් දශක දෙකක සීමාව තුළ රටට මුහුණ දීමට සිදු වූ ප්‍රබලතම සිදුවීම් වන යුධමය තත්ත්ව, නිදහස ලැබීම්, සුනාමි උවදුරු, ආර්ථික අර්බුද, ආහාර අර්බුද යන විශේෂ සිදුවීම් මෙම කාලසීමාව තුළ සිදුවී ඇති අතර එවැනි අවස්ථාවලදී රජයන් ඊට මුහුණදුන් ආකාරය, ඊට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවූ ආකාරය එම ප්‍රතිපත්තිවල සාර්ථක අසාර්ථක බව මෙයින් විග්‍රහයට බඳුන් කෙරේ.

**හැඳින්වීම**

ආර්ථික විද්‍යාවේ විෂය පථයට ඇතුළත් වන වැදගත් ක්ෂේත්‍රයක් ලෙස ප්‍රතිපත්ති පිළිබඳ ආර්ථික විද්‍යාව හඳුන්වා දිය හැකිය. ආර්ථික ප්‍රතිපත්ති යන්න යම්කිසි නිශ්චිත ප්‍රශ්නයක් විසඳීමට හෝ සේවා නියුක්තිය, නිෂ්පාදිතය, විනිමය අනුපාතිකය සහ ගෙවුම් ශේෂය යන ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් පහට සම්බන්ධ ප්‍රතිපත්තිමය ඉලක්ක කාණ්ඩයක් සාක්ෂාත් කර ගැනීම සඳහා ආර්ථික විද්‍යා න්‍යායන් පදනම් කරගනු ලබන ක්‍රියාමාර්ගයක් ලෙස නිර්වචනය කළ හැකිය (ආර්ථික විමසුම-දෙසැ/ජන., 2012). රටක ආර්ථික සංවර්ධන ක්‍රියාදාමය තුළ ප්‍රමාණාත්මක දියුණුවත් සමඟ ආර්ථිකය තුළ ගුණාත්මක ප්‍රගතියක්ද අපේක්ෂා කරනු ඇත. ඒ වගේම කාලානුරූපීව වෙනස්වන ආර්ථික අරමුණු සමුදායක් සහ එම අරමුණු ළඟාකර ගැනීමට උචිත ප්‍රතිපත්තියක් ද සැලකිල්ලට භාජනය කරනු ලැබේ. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ සැලකිළිමත් වීමේදී සමස්ථයක් ලෙස එය ආර්ථික මෙහෙයුම සමග සම්බන්ධ වේ. පුළුල් අර්ථයෙන් ගත් කළ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ඉලක්ක රැකියාව, ධනය හා වැඩි දියුණු ජීවන තත්ත්වයන් නිර්මාණය කිරීම ශක්තිමත් කිරීම සහ තිරසාර ආර්ථික වර්ධනය, ස්ථාවර ආර්ථික පරිසරයක් නිර්මාණය දැක්විය හැක. මෙහි ප්‍රධාන මෙවලම් වශයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, මූල්‍ය ප්‍රතිපත්තිය හා විනිමය ප්‍රතිපත්තිය හඳුන්වා දිය හැක.

---

* *තාවකාලික කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, thusha.hettiarachchi@gmail.com*

20 වන සියවස තෙක් ආර්ථිකය සම්බන්ධයෙන් රජයේ ප්‍රධාන වගකීම වූයේ රටේ ජනතාවගේ භෞතික ධනය රඳා පවතින පෞද්ගලික ආර්ථික කටයුතුවල යෙදීම සඳහා රට වැසියන්ට උපකාරීවන පරිදි නීතිය හා සාමය පිළිබඳව ස්ථාවර පසුබිමක් පවත්වා ගැනීම ගිවිසුම්වල ආරක්ෂාව සැලසීම ය. අතීතයේදී මිල මට්ටම හැර අනෙකුත් සාර්ව ආර්ථික විචල්‍යයන් රාජ්‍ය ප්‍රතිපත්තියේ වගකීමක් ලෙස නොසැලකී ය. 1930 ගණන්වලදී ඇතිවූ මහා අවපාතය ඇතිවීම සහ එහි කොටසක් වශයෙන් දැඩි සේවා වියුක්තියක් පැවති තත්ත්වයට ප්‍රතිචාර වශයෙන් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති යන්න බිහිවිය. එතැන් පටන් රටේ සමස්ථ ආර්ථික ක්‍රියාකාරකම් මට්ටම පිළිබඳව සැලකිය යුතු බලපෑමක් කිරීමට රාජ්‍ය ප්‍රතිපත්තියට හැකි බව ආර්ථික විද්‍යාඥයින් විසින් අවබෝධ කරගෙන ඇත. වර්තමානය තුළ සෑම රටක් පාහේම තම රටේ ආර්ථිකයේ නිරෝගිභාවය පිළිබඳව වගකිවයුතු බව සැලකේ. මැතිවරණකාලයේදී රජයන් පිළිබඳ විනිශ්චයන් ගනු ලබන්නේ කාර්ය සාධනය පදනම් කර ගෙන ය. සාර්ව ආර්ථිකමය ප්‍රතිපත්තිවලට ඇතුළත්වන කරුණු වන්නේ ආර්ථික වර්ධනය, ආර්ථික කාර්යක්ෂමතාව, පූර්ණසේවා නියුක්තිය, මිල ස්ථායිතාව, ආර්ථික නිදහස, සම ආදායම් ව්‍යාප්තිය, ආදායම් සුරක්ෂිතතාව, විදේශ ගිණුම් පරිසරය ඇතුළත් කළ හැකිය. රජයන් සතුව සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන කාණ්ඩ දෙකක් පවතී. එනම් ඉල්ලුම් පාර්ශවයේ ප්‍රතිපත්ති හා සැපයුම් පාර්ශවයේ ප්‍රතිපත්ති වේ.

වර්ෂ 1948 ශ්‍රී ලංකාව නිදහස ලබා ගැනීමෙන් අනතුරුව බලයේ සිටින රජයන් විසින් පිළිගත් ආර්ථික ප්‍රතිපත්ති අනුව ඔවුන්ගේ සංවර්ධන උපාය මාර්ග සඳහා විවිධ ආර්ථික ආදර්ශයන් සහාය කොට ගෙන ඇත. කෙසේ වෙතත් 1994-2014 කාලසීමාව තුළ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ඇගයීම වඩාත් උචිත වනු ඇත. මන්ද යත් දශක දෙකක සීමාව තුළ රටට මුහුණ දීමට සිදු වූ ප්‍රබලතම සිදුවීම් වන යුධමය තත්ත්වයන්, නිදහස ලැබීම්, සුනාමි උවදුරු, ආර්ථික අර්බුද, ආහාර අර්බුද යන විශේෂ සිදුවීම් මෙම කාලසීමාව තුළ සිදුවී ඇති අතර එවැනි අවස්ථාවලදී රජයන් ඊට මුහුණදුන් ආකාරය, ඊට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවූ ආකාරය එම ප්‍රතිපත්තිවල සාර්ථක අසාර්ථක බව මෙයින් විග්‍රහයට බඳුන් කෙරේ.

**1994න් පසු කාලය - මානුෂීය මුහුණුවරින් යුත් විවෘත ආර්ථිකය**

1994 මහ මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නායකත්වය ලබා දුන් පොදුජන සන්ධානය බලයට පත්වීමත් සමඟ වසර 17 ක කාලයක් පුරා අඛණ්ඩව බලයේ රැඳී සිටි එක්සත් ජාතික පක්ෂ රාජ්‍ය පාලනය නිමාවට පත්විය. කෙසේ වෙතත් පොදුජන සන්ධානය මගින් ප්‍රතිඥා දුන් පරිදි විවෘත ආර්ථික ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන ගියහ. මෙහිදී ආර්ථිකය නිසි මගට මෙහෙයවීම සම්බන්ධයෙන් පෞද්ගලීකරණ අංශයේ කාර්ය භාරය අවධාරණය කළහ. අපේක්ෂිත ආර්ථික කළමණාකරණයට පටහැනි ආකාරයෙන් පොදුජන සන්ධානය තුළ වූ තරඟකාරී දේශපාලන පක්ෂ තෘප්තිමත් කිරීම කෙරේ වැඩි අවධානයක් යොමු කිරීමට සිදු වූ බැවින් රජයේ ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වූ ස්ථාවරත්වයට පැවතියේ සෘණාත්මක බලපෑමකි (ආර්ථික විමසුම-ඔක්/නොවැ., 2008). මේ ආකාරයට 1994 බලයට පත් රජය වර්ෂ 2014 වන තෙක් රට පාලනය කළහ. වර්ෂ 2001 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් බලයට පත් වුවත් අවුරුදු දෙකක පාලනයෙන් පසුව නැවතත් සන්ධාන

රජය බලයට පත් විය. මෙම කාලය තුළ සිදුවූ විශේෂ සිදුවීමනම් සටන් විරාම ගිවිසුමක් ඇති කර ගැනීමයි. දශක දෙකක සාර්ව ආර්ථිකය පිළිබඳ විමසා බැලීමේදී, සමස්ථයක් වශයෙන් ගත් කළ දළ දේශීය නිෂ්පාදිතයේ අගය වැඩිවීමද, සේවා වියුක්තිය අඩුවීම, දරිද්‍රතාව අඩුවීම, ආදී විශේෂ තත්වයන් දැකගත හැකිය. ඒවායේ ස්වභාවය ප්‍රස්ථාර සටහන් මගින් පෙන්නුම් කළ හැකිය.

**ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය**




ඉහත ප්‍රස්ථාර සටහන තුළින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ක්‍රම ක්‍රමයේ වැඩි වී ඇති බවයි.

**ශ්‍රී ලංකාවේ සංචාරකයින්ගේ පැමිණීමේ ස්වභාවය**




ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණීම 2006 දී පැමිණි ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් අඩුවීමක් 2009 වර්ෂය තුළදී දැකගත හැකිය. එයට විශේෂයෙන්ම හේතු වන්නේ දශක දෙකකට ආසන්න කාලසීමාවක් තුළ පැවත් යුධමය තත්ත්වයයි. ඉන් පසු කාලීනව ශ්‍රී

ලංකාවේ ආරක්ෂාව තහවුරු වීමත් සමග සංචාරක පැමිණීම සතුටු දායක මට්ටමක පවතින බව ඉහත ප්‍රස්ථාර සටහන තුළින් පැහැදිලි වනු ඇත.

**ශ්‍රී ලංකාවේ දශක දෙකක සේවා වියුක්තියේ ස්වභාවය**




ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියේ ස්වභාවය පිළිබඳ ඉහත ප්‍රස්ථාරයෙන් පැහැදිලිවනු ඇත. 1998-2001 තුළ සේවා වියුක්තිය ඉතා අඩු වීමක් පෙන්නුම් කර ඇත. ඉන් පසු කාල සීමාව තුළ සේවා වියුක්තියෙහි යම් යම් උස් පහත් වීම් සිදුවී ඇත. කෙසේ වෙතත් වර්තමානයේ සේවා වියුක්ති අගය අඩු අගයක් පෙන්නුම් කරනු ලබයි. මෙම සාර්ව ආර්ථික දත්තවල ඇතිවූ වෙනස්කම්වලට එම දශක දෙක සිදු වූ සුවිශේෂී හේතූන් බලපා ඇත. එම දශක දෙකක කාලය තුළ සිදුවූ ඉතාමත් සුවිශේෂී වූ සිදුවීම් සහ ඒ සඳහා රජය අනුගමනය කළ ප්‍රතිපත්ති මෙහිදී තව දුරටත් විග්‍රහ කෙරේ.

**යුධමය තත්ත්වය සහ ඒ සඳහා ශ්‍රී ලංකාව මුහුණදුන් ආකාරය, අනුගමනය කළ ක්‍රියා මාර්ග**

විසිවන සියවසේ අවසාන කාර්තුවේදී වෙළඳපොළාභිමුඛ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් තුළ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපෑ ප්‍රධාන හේතුවක් වූයේ සිවිල් යුද්ධයයි. මුලදී ගරිල්ලා සටනක් ලෙස ආරම්භ වූ උතුරු නැගෙනහිර සිවිල් නොසන්සුන්තාව කෙටිකාලයක් තුළදී සම්ප්‍රදායික සිවිල් යුද්ධයක් බවට වර්ධනය වූ අතර එය දේශපාලන ස්ථාවරභාවයට තර්ජන එල්ල කිරීමටත් සහ ආර්ථික සංවර්ධනය දුර්වල කිරීමටත් හේතු විය. මෙය ආර්ථිකය පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක වීම වළක්වාලමින් ද ඵලදායිතාවය වර්ධනය වීම නවතාලමින් ද සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාවට බාධා කරමින් ද රට පුරා යෙදවුම් සහ අවසාන නිෂ්පාදිතවල නිදහස් සංචලනයට බාධා පමුණුවමින් ද ආර්ථිකය මත විශාල පිරිවැයක් ඇති කළේ ය.

ආර්ථික කටයුතුවලට මෙයින් ඇතිවූ අයහපත් බලපෑම උතුරට සහ නැගෙනහිරට පමණක් සීමා නොවූ අතර රටේ සෑම ප්‍රදේශයකම පිළිඹිබු විය. මේ තුළින් ඇතිවූ ප්‍රතිඵලය වූයේ වෙළඳපොළ පිළිබඳ විශ්වාසය බිඳවැටීම නිසා විශේෂයෙන්ම අනවශ්‍ය විදේශ ආයෝජනය ගලා ඒම් අධෛර්යමත් කරමින් ආයෝජන ප්‍රසාරණය සීමා විය. එමෙන්ම ආරක්ෂක වියදම් ඉහළ යාම හේතුවෙන් රාජ්‍ය ණය බර වැඩි කරමින් ද, ආර්ථික සංවර්ධනය

සඳහා ලබා ගත හැකි සම්පත් ප්‍රමාණය අඩුකරමින් ද අයවැය හිඟය පුළුල් විය. රජයේ ණය ගැනීම් ඉහළ යාම සහ හමුදා උපකරණවල ආනයනය ඉහළ යාම මගින් දේශීය පොළී අනුපාතිකය සහ විනිමය අනුපාතික කෙරෙහි ද පීඩනයක් ඇති කළේය. යම් යම් අධ්‍යයන ඇස්තමේන්තුවලින් දක්වා ඇති පරිදි සිවිල් නොසන්සුන්තාවයන් නිසා වාර්ෂික ආර්ථික වර්ධනය අඩුම තරමින් සියයට දෙකකින්, එනම් පසුගිය වර්ෂ 20 තුළදී ප්‍රතිශතාංක 40 කින් අහිමි කිරීමට හේතු වී ඇත (මහ බැංකුව, 2002).

කෙසේ වෙතත් දශක 3ක් පමණ කාලයක් පුරාවට ගැටුම් පැවති නමුදු 1983 සිට 2008 දක්වා කාලය රටේ සාමාන්‍ය වර්ධනය වසරකට 4.8%ක් ආසන්නව පවත්වාගෙන යාමට හැකිවිය (ආර්ථික විමසුම-ජනවාරි, 2010). මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ ඇඟලුම් නිෂ්පාදන සහ ගැටුම නිසා ඇතිවූ විනාශයෙන් එතරම් අහිතකර බලපෑමක් ඇති නොවූ සේවා සැපයුම් අංශ කිහිපයක කටයුතු ඇතුළු ඇතැම් අංශවල ක්‍රියාකාරකම් ය.

රට තුළ ගැටුම්කාරී තත්ත්වයක් නොපැවතුනේ නම් රට මෙයට වඩා වැඩි වර්ධනයක් අත්පත් කරගත හැකිවනු ඇත. විශේෂයෙන්ම ගැටුම්වලින් අනතුරුව බිහිවී ඇති වාතාවරණය සහ ගෝලීය ආර්ථිකය අනුක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීමට උතුරු නැගෙනහිර පළාත්වලට පෙර නොවූ විරූ අවස්ථා සැදී තිබීමත් නිසා අනාගතයේදී මුළු රටටම යහපත් කාලයක් උදාවනු ඇත (ආර්ථික විමසුම-ජනවාරි, 2010). විශේෂයෙන්ම යුද්ධය උතුරු නැගෙනහිර ජනතාව පමණක් නොව රටේ සමස්ථ ජනතාවම පීඩා වින්දහ. මරුමුවට පත්වීම, ගේ දොර අහිමි වීම, ආදී ලෙස මානව ව්‍යසන රැසක් ඇති කළහ. භෞතික වශයෙන් සැලකූ කල යටිතල පහසුකම් විනාශයට පැමිණවීමක් මෙයින් සිදුවිය. සේවා සැපයුම් අංශවල ධාරිතාව හීන කරනු ලබයි. විශේෂයෙන්ම ගැටුම් පැවති ප්‍රදේශවල අධ්‍යාපනය සහ සෞඛ්‍ය ඇතුළු සේවාවන්හි යහ පැවැත්මට බාධා පමුණුවනු ලබයි. පාලන ක්‍රමයේ ව්‍යුහයන් සඵලදායී ලෙස ක්‍රියාත්මක වීම වලක්වාලමින් සංක්‍රමණයන්ටත් ඒ සමග බැඳුණු මානව ප්‍රාග්ධනය අහිමි වීමට මෙය හේතු වේ. කෙසේ වෙතත් දිගින් දිගටම ඇදී ගිය ගැටුම නිමාවට පත්වීම ශ්‍රී ලංකාවට වඩාත් සාමකාමී යුගයක් උදාකරලීම පිළිබඳ අලුත් අපේක්ෂාවන් සහ විශ්වාසයන් ගොඩනංවා තිබේ.

යුද්ධය පවතින කාල සීමාව තුළ ශ්‍රී ලංකාව ඉන්දියාව සමග ආර්ථික වශයෙන් ගනු දෙනු කොට ඇත. එනම් රටවල් අතර වෙළඳාම ද පදනම් කරගෙනය. ද්වි පාර්ශවික වෙළඳාම වසර 2000 දී ඩොලර් බිලියන 3.2 ක් ද වර්ෂ 2008දී ඩොලර් බිලියන 6.5 ක් ද වශයෙන් පවතී. ඒ වගේම චීනය, රුසියාව, ඉරාණය වැනි රටවල් ශ්‍රී ලංකාවට සහයෝගය දක්වා ඇත. විශේෂයෙන්ම යුධමය කාලසීමාව තුළදී අනෙක් ප්‍රබල රාජ්‍යයන්ගෙන් බලපෑම් එල්ලවන විට සහයෝගය ලබා දුන් ප්‍රධාන රාජ්‍යයන් 2ක් ලෙස චීනය සහ රුසියාව හඳුන්වා දිය හැකිය. කෙසේ වෙතත් යුද්ධය අවසන් වීමත් සමග රටට යහපත් කාලයක් උදා වී ඇත. සෑම ක්ෂේත්‍රයකම වර්ධනයක් සිදුවී ඇත. සේවා වියුක්තිය, දරිද්‍රතාව අඩු මට්ටමකට පැමිණ ඇත. සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනයක් සිදු වී ඇත. වර්තමානය තුළ ශ්‍රී ලංකාව නිදහස් රාජ්‍යයක් බවට පත් වී ඇත. 1994 සිට 2014 දක්වා සාර්ව ආර්ථිකයට බලපෑම් කළ ප්‍රබල හේතුවක් වූ යුධමය තත්ත්වය සහ ඒ ආශ්‍රිත ක්‍රියා මාර්ග ඉහතින් විග්‍රහ කෙරේ. මීන්

අනතුරුව සුනාමි ව්‍යසනය හා එයින් ඇතිවූ බලපෑම්, අනුගමනය කළ ප්‍රතිපත්ති පහතින් විග්‍රහ කෙරේ.

**සුනාමි ව්‍යසනය හා ශ්‍රී ලංකාව එයට මුහුණ දුන් ආකාරය, අනුගමනය කළ ප්‍රතිපත්තීන් හා ක්‍රියාමාර්ග**

2004 දෙසැම්බර් 26 වන දින ආසියාවේ රටවල් කිහිපයකට දැඩි අලාභහානි සිදු කරමින් වසර 40 කින් ලෝකයේ දක්නට ලැබුණු ඉතාම ප්‍රබල භූමිකම්පාවකින් හටගත් සුනාමියෙන් බරපතලම බලපෑමට ලක්වූ කලාපයේ රටවල් දෙකෙන් ශ්‍රී ලංකාවද එකක් වේ. ශ්‍රී ලංකාවේ සිදුවූ ජීවිත හානිය 31000ට වැඩිවූ අතර 15000කට වැඩි සංඛ්‍යාවක් තුවාල ලැබූහ. 5000ක් පමණ අතුරුදහන් විය. සිදු වූ හානිය දළ දේශීය නිෂ්පාදිතයෙන් 5%ක් වෙතැයි ඇස්තමේන්තු කරනු ලැබේ. නිවාස, පෞද්ගලික දේපළ, පාසැල්, රෝහල්, යටිතල පහසුකම්, ජල හා විදුලි සැපයුම්, විදුලි සංදේශ හානියට ලක්වීම සිදුවිය. සමාජීය අවුල් සහගත බව සහ ඛේදනීය ලෙස මිනිස් ජීවිත අහිමි වීමමෙන්ම නිවාසවලට හා ව්‍යාපාරවලට වූ අහිතකර බලපෑම තුළින් රට දැඩි අභියෝගයකට මුහුණ පෑහ. විශේෂයෙන්ම සුනාමියෙන් බරපතලම බලපෑමට ලක් වූ උතුරු නැගෙනහිර මෙන්ම දකුණු හා බටහිර වෙරළබඩ ප්‍රදේශ විශාල සංඛ්‍යාවක් ඉහළදරිද්‍රතා මට්ටමක් නියෝජනය කළ නිසාවෙන් එම ප්‍රදේශ නැවත ඉදිකිරීම පිළිබඳ බහුවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදුවිය. සුනාමි ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම අවධානයට ලක්වූයේ රටේ අඩුවෙන්ම සංවර්ධනය වූ හා දැඩි ලෙස දිළිඳුකමින් පීඩා විඳි ප්‍රදේශ ය.

සුනාමියෙන් ඇතිකළ සියලු ප්‍රතිඵල රජයට තනිව ජය ගැනීමට නොහැකි බව පැහැදිලි බැවින් අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් රජයට වෙනත් පාර්ශවයන්ගේ සහය අවශ්‍ය විය. විවිධ සංවිධාන සුනාමියෙන් විනාශ වූ ප්‍රදේශ යළි ගොඩ නැගීමට සම්බන්ධ වූහ. ඒවායේ ධනාත්මක මෙන්ම සෘණාත්මක බලපෑම් ද පවතී. එනම් සමහර සංවිධාන විපතට පත් වූවන් වෙනුවෙන් කටයුතු කරන අතරතුර එයට ප්‍රතිවිරුද්ධ අප්‍රකට අභිමතාර්ථයන් ඇතිව කටයුතු කරනු ඇත. මෙම චෝදනාව වඩාත් එල්ල වන්නේ රාජ්‍ය නොවන සංවිධානවලටයි. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය, ආසියානු සංවර්ධන බැංකුව ලෝක බැංකුව ආදී ජාත්‍යන්තර නියෝජිත ආයතන මෙහිදී තීරණාත්මක වැදගත්කමක් හිමි කරගනු ලබයි.

සුනාමි බලපෑම් ඇතිවූ පවුල්වලට සහන සැලසීම සඳහා 2005 දී රජය රුපියල් බිලියන 12ක් වැය කර ඇත. යථා තත්ත්වයට පත් කිරීම හා යළි ඉදිකිරීම කටයුතු සඳහා වසර 3-5 අතර කාලයක් ගතවනු ඇතැයි ද ඒ සඳහා එ.ජ ඩොලර් බිලියන 2.2ක් වැයවනු ඇතැයි අපේක්ෂා කෙරේ. යථා තත්ත්වයට පත් කිරීම හා ඉදිකිරීම් කටයුතු වශයෙන් එ.ජ ඩොලර් බිලියන 2.8 ක් සහ ණය සහන වශයෙන් එ.ජ ඩොලර් දස ලක්ෂ 258.6ක් ලබා ගැනීමට ආධාර සපයන ජාත්‍යයන්තර ප්‍රජාව පොරොන්දු වී ඇත (මහ බැංකුව, 2005). පශ්චාත් සුනාමි යථා තත්ත්වයට පත් කිරීම් සහ යළි ඉදිකිරීම් ප්‍රධාන වශයෙන් වැඩසටහන් 4 ක් යටතේ ක්‍රියාත්මක විය.

- නිවාස ඉදිකිරීම්
- ජීවනෝපාය මාර්ග ප්‍රතිෂ්ඨාපනය කිරීම
- සෞඛ්‍ය, අධ්‍යාපනය හා ආරක්ෂාව සැලසීම
- ජාතික යටිතල පහසුකම් ගොඩනැගීම

2005 දී මුළු රාජ්‍ය වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 1.6% කින් වර්ධනය වූ අතර එය සහනදායී විදේශ ආධාර හා ආපසු ගෙවීමේ පනත යටතේ වූ තාවකාලික ඉදිකිරීම් මගින් මූල්‍යයනය කරන ලදී. 2005 ආරම්භයේදී අපේක්ෂා කළ එ.ජ ඩොලර් දස ලක්ෂ 501 ක අතිරික්තයක් වාර්තා කළේය (මහ බැංකුව,2005). කෙසේ වෙතත් සුනාමි ව්‍යසනයෙන් සිදුවූ බලපෑම අතිමහත්ය. එම අවස්ථාවේදී ලෝකයේ සංවර්ධිත මෙන්ම අනෙකුත් රටවල් ද විශාල වශයෙන් ආධාර ලබා දුන්හ. නමුත් මෙම ආධාර සාධාරණ ලෙස බෙදීගියේ ද යන්න ගැටලු සහගත වේ. විශේෂයෙන්ම එම ආධාර දේශපාලන බලය හිමි වූවන්ගේ ගසා කෑම්වලට ද ලක්විය. එසේ නොවුනේ නම් එම ලැබුන ආධාරවලින් අප රට සංවර්ධිත තත්ත්වයට පත් කර ගැනීමට හැකියාව පැවති බව ආර්ථික විශේෂඥයින්ගේ මතය විය. කෙසේ වෙතත් වර්තමානය වන විට සුනාමියෙන් පීඩාවට පත් වූ ප්‍රදේශයන්හි නැවත ගොඩනැගීම් අවසන් වී ඇත. ආර්ථිකය සුපුරුදු පරිදි ක්‍රියාත්මක වෙමින් පවතී. විශේෂයෙන්ම පසුගිය දශක දෙක තුළ සිදුවූ විශේෂ සිදුවීමක් ලෙස සුනාමි ව්‍යයසනය සහ එහිදී රජය ක්‍රියාත්මක වූ ආකාරය, ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ඉහත පරිදි විග්‍රහ කළ හැකිය.

එසේම ලෝක ආර්ථික අර්බුද ඇතිවීම ද පසුගිය කාල සීමාව තුළ සිදුවූ විශේෂ සිදු වීමකි. එවැනි අවස්ථාවකදී ලෝකයේ රටවල් එයට මුහුණ දුන්නේ කෙසේද එලෙසම ශ්‍රී ලංකාව එයට මුහුණ දීම සහ එහිදී අනුගමනය කළ ප්‍රතිපත්ති මොනවා ද යන්න විග්‍රහ කිරීම වැදගත් වේ.

**ලෝක ආර්ථික අර්බුද**

**1997 වර්ෂයේදී නැගෙනහිර සහ අග්නිදිග ආසියාවේ හටගත් මූල්‍ය අර්බුදය**

නැගෙනහිර සහ ආසියාවේ රටවල ආර්ථික තත්ත්ව ශක්තිමත්ව පවත්වාගෙන යමින් එක විටම එම රටවල තුළිත ආර්ථික වර්ධනයක් ඇතිකරගනු ලැබිණි. ඉහළ ආර්ථික වර්ධන අනුපාතයන්, අඩු උද්ධමන අනුපාතයන්, අධික දේශීය ඉතිරිකිරීම් හා ආයෝජන මට්ටම්, වෙළඳ ශේෂයන් සහ අයවැය හිඟය අඩු මට්ටමක පැවතීම යන අංශයන් මෙම තුළිත වර්ධනය තුළ දක්නට ලැබුණි. ඉහළ වර්ධන වේගය වාර්තාකරනු ලැබුවේ තායිලන්තය, මැලේසියාව, ඉන්දුනීසියාව සහ සිංගප්පූරුව සහ දකුණු කොරියාව යන රටවල් දේශීය මෙන්ම බාහිර සාධක හේතුකොට ගෙන 1996 වන විට වර්ධන වේගය අඩාලවීමේ සළකුණු ප්‍රදර්ශනය කරනු ලැබීය.

තාක්ෂණික අංශයේ සිදුවූ ප්‍රසාරණය නිසාවෙන් ඉහළ වර්ධන අනුපාතයක් පවත්වා ගත්හ. කෙටිකාලීන වශයෙන් ඇතිවන ප්‍රතිලාභයන් නිසා විදේශීය ආයෝජකයන් ආසියානු

රටවල පුළුල් වශයෙන් ආයෝජනය කරනු ලැබීය. මෙහිදී වෙළඳපොළ විදේශීය ආයෝජකයන් විසින් මෙහෙයවනු ලැබීම හේතුවෙන් විදේශීය ප්‍රාග්ධනයරට තුළට ගලා ඒම දිරි ගැන්වූ අතර අධික පොළී අනුපාත හේතුවෙන් දේශීය ආයෝජකයින් අධෛර්යමත් කරනු ලැබීය. වෙනත් රටවල් පිළිබඳ විමසීමක් කළහොත් තායිලන්තයේ රෙදිපිළි පාවහන් ප්ලාස්ටික් සහ ඇඟලුම් ශ්‍රම පිරිවැය අග්නිදිග ආසියාවේ වෙනත් රටවල පවත්නා ශ්‍රම පිරිවැය මෙන් තුන් ගුණයට වඩා වැඩිවිය. නැගෙනහිර සහ අග්නිදිග ආසියානු රටවලින් වැඩි කොටසකට වැඩි කොටසකට ව්‍යවහාර මුදල් එක්සත් ජනපද ඩොලරය මත එල්ලා තිබූ නිසා එක්සත් ජනපද ඩොලරයෙහි අගය වැඩිවීම ආසියානු නිර්යාතයන්ට එල්ලවූ පහරක් විය. ආසියානු රටවලින් වැඩි කොටසක් ප්‍රධාන වශයෙන් පෞද්ගලික පරිඝණක සහ අර්ධ සන්නායකයන් අපනයනකරුවන් වූ බැවින් ඩොලරයේ අගය වැඩිවීම හැරුණුවිට විද්‍යුත් භාණ්ඩ සඳහා වූ ඉල්ලුම පහත වැටීම ද ආසියානු ආර්ථිකයන්ට අහිතකර ලෙස බලපානු ලැබීය (ආර්ථික විමසුම-දෙසැ/ජන.,2009).

**ශ්‍රී ලංකාව නැගෙනහිර ආසියානු අර්බුදයට මුහුණ දුන් ආකාරය**

අවිනිශ්චිත ලෝක වාතාවරණය යටතේ දුෂ්කරතාවන්ට මුහුණ දීමට ශ්‍රී ලංකා ආර්ථිකයට 1997 දී හැකියාව ලැබිණි. 1970 ගණන්වල මුල් භාගයේදී බ්‍රෙට්න් වුඩ්ස් ක්‍රමය බිඳ වැටීමෙන් පසුව ඇතිවූ දරුණුතම අර්බුදය වන නැගෙනහිර ආසියානු අර්බුදයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට ඇතිවූයේ සුළු බලපෑමකි. මන්ද යත් ශක්තිමත් හා මූල්‍ය ක්‍රමයක, යෝග්‍ය සාර්ව ආර්ථික හා විනිමය අනුපාතික ප්‍රතිපත්ති, දූරදර්ශී අධීක්ෂණ ක්‍රමයක් පවත්වා ගැනීම යන ආදියෙහි වැදගත්කම මෙම මූල්‍ය අර්බුදය මගින් පැහැදිලිව පෙන්වා දී ඇත. මෙහිදී ශ්‍රී ලංකාවේ ජංගම ගිණුමු ගනුදෙනු මුළුමනින්ම නිදහස් කර ඇත. මීට අමතරව අපනයන ලැබීම් භාරදීමේ අවශ්‍යතාව නොමැත. ප්‍රාග්ධන ගිණුම නිදහස් කිරීමේදී පවා ප්‍රවේශම්ක්‍රමයක් රට අනුගමනය කර ඇත. ප්‍රාග්ධන ගිණුම තරමක් දුරට නිදහස් කර ඇති අතර මෙය බොහෝ සංවර්ධනය වන රටවලට වඩා නිදහස් තත්ත්වයකි.

1995 ට පෙර විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක හැර ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවලට දේශීයන්ගෙන් ණය ලබා ගැනීමට අවසර දී නොතිබිණි. ඔවුන්ට දිනපතා ක්‍රියාකාරී ශේෂයන් පවත්වා ගැනීමට පමණක් හැකියාව තිබුණි. මේ තුළින් දේශීය බැංකු මෙන්ම දේශීය ව්‍යවසායකයන්ද විදේශීය අංශය වෙත අධික ලෙස විවෘත වීමෙන් ආරක්ෂා කළේය. අනෙක් අතට අර්බුදයක් පවතිද්දීත් 1997 දී ස්ථායී මූල්‍ය වෙළඳපොලක් පවත්වා ගැනීමට උපකාරී වූ අනෙක් සාධකය නම් නම්‍යශීලී විනිමය අනුපාතික කළමනාකරණයයි. විනිමය මිලදී ගැනීම් හා විකුණුම් අනුපාත අතර 2% ක පරතරයක් පවත්වා ගනිමින් ශ්‍රී ලංකා මහබැංකුව විනිමය අනුපාතිකවල ඇති අධික විචලනයන් අඩු කිරීමට මැදිහත් විය. ද.දේ.නි. අනුපාතයක් වශයෙන් මුළු ණය තොගය 1996 දී පැවති 70% සිට 1997 දී 63% දක්වා පහත වැටුණි. ණය සේවා ගෙවීම්ද පහසුවෙන් පාලනය කළ හැකි මට්ටමක පැවතුන නිසා ශිෂ්ට ප්‍රයෝග සහ බැංකු කටයුතු පිළිබඳ දක්වන ලද ඉහළ සුපරික්ෂාකාරී වීමද එමගින් කරන ලද කාලීන හා උචිත මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රතිචාරයන් නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුධයේ

උච්චතම අවස්ථාවේදී දේශීය මූල්‍ය වෙළඳපොලේ ඇතිවිය හැකිව තිබූ අධි සමපේෂණ තත්ත්වයන්ට එරෙහිව ක්‍රියාත්මක වීමට උපකාරී විය (මහ බැංකුව, 1997).

නැගෙනහිර ආසියානු අර්බුද කෙටි කාලීන තත්ත්වයන්ගේ ප්‍රතිවිපාක මගහරවා ගත් නමුත් දියමන්ති, රබර් සහ පොල් වැනි ඇතැම් විශේෂිත අපනයන අධිතමයන් නැගෙනහිර ආසියාතික රටවලින් පැවති ඉල්ලුමේ තියුණු සංකෝචනයන් මුදලේ අගය පහත වැටීම නිසා මිල පහත වැටීමත් හේතුවෙන් දැඩි තරඟකාරීත්වයකට ලක් විය. කෙසේ වෙතත් නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදය ශ්‍රී ලංකාවට එතරම් බලපෑමක් සිදුකර නැති බව පැහැදිලිවනු ඇත.

**ලෝක මූල්‍ය අර්බුදය 2007-2012**

2007 වර්ෂයේ අගෝස්තු මාසයේ සිට ලෝකය පුරා මූල්‍ය හා ආර්ථික අර්බුදයන් ව්‍යාප්ත වූ අතර එය ඇ.එ.ජ. ප්‍රමුඛ නොවන උකස් ණය වෙළඳපොළින් ඇතිවූ බවට පොදුවේ අදහස් කෙරේ. ප්‍රමුඛ නොවන උකස් ණය සම්බන්ධ සුරැකුම්ගත මූල්‍ය වෙළඳපොල පිළිබඳ ආයෝජකයන්ගේ විශ්වාසය බිඳී යාමෙන් වෙළඳපොලේ ගනුදෙනු වූ විවිධ සුරැකුම්ගත බැඳුම්කර සහ සුරැකුම් කෙටි කාලයක් තුළ අලෙවි කිරීමත් ඒවායේ ඉල්ලුම කඩා වැටීමත් හේතු කොට ගෙන මෙම අර්බුදය ආරම්භ වූ අතර පසුව ලෝකය පුරා බැංකු සහ මූල්‍ය වෙළඳපොලවල් පිළිබඳවද විශ්වාසය ක්‍රමයෙන් බිඳවැටෙමින් ලෝක මූල්‍ය අර්බුදයක් වශයෙන් ව්‍යාප්ත විය (සමරසිරි, 2013).

විශේෂයෙන්ම එක්සත් ජනපදයේ දේපළ හා නිවාස අංශයේ හටගත් වෙළඳ පරිහාණිය ධනවත් මෙන්ම දිළිඳු රටවලට පැතිරෙන්නා වූ ගෝලීය ආර්ථික අර්බුදයක් ලෙසින් ප්‍රකාශ විය. එක්සත් ජනපදයේ අධික පරිභෝජන රටාවන් තුළින් අර්බුධය හට ගැනුනි. මධ්‍යයෙහ් ඇතිවූ බිඳවැටීම එක්සත් ජනපදය මත රඳා පවතින්නා වූ සෙසු ආර්ථිකයන් කෙරේ නිශේධනාත්මක ප්‍රතික්‍රියා ක්‍රමයක් ඇති කළහ. චීනය ජපානය ඩොලර් නමින් වූ වත්කම් රැස් කිරීමට උත්සුක වූ අනෙකුත් ආසියානු රටවල වෙළඳ අතිරික්තයක් ඇති කරමින් වසර ගණනාවක් පුරා වර්ධනය වන්නා වූ එක්සත් ජනපද මූල්‍ය හිඟය පියවීමට මුදල් සැපයිනි.

ප්‍රාග්ධනය විශාල වශයෙන් රට තුළට ගලා ඒම සහ මූල්‍ය පිළිවෙත ලිහිල් කිරීම මගින් අඩු පොළී අනුපාත පවත්වාගෙන යාමට එක්සත් ජනපදයට හැකි විය. අඩු පොළී අනුපාත මගින් ආදායම් මට්ටම වැඩිවීමේ විකල්ප ආයෝජන මූලාශ්‍ර පිළිබඳ පාරිභෝගිකයන් තුළ අපේක්ෂාවන් ඇති කරනු ලැබූ අතර දේපළ හා නිවාස මගින් ප්‍රදානය කරන ලද ආකර්ශනීය පොළී මගින් මෙම සෙවීම සපුරාලනු ලැබීය. දේපළ හා නිවාස සඳහා ඇති ඉල්ලුම ප්‍රබල ලෙස ඉහළ නැංවීය. මේ හේතුවෙන් සමපේෂණ මායාවක් දෘෂ්‍යමාන විය. දේපළ හා නිවාස මිලදී ගැනීම සඳහා ණය ලබා ගැනීමේදී බැංකු ලිහිල් ප්‍රතිපත්ති අනුගමනය කළහ. කෙසේ වෙතත් අවසානයේ සමපේක්ෂණ මායාව පුපුරා යමින් ඇතිවූ තත්ත්වය නිසා බැංකු වසා දැමීමේ වාවතකට පිවිසීමට සිදුවිය.

විදේශීය රටවලට මූල්‍ය අර්බුදය පැතිර ගියේ මූලික වශයෙන් හේතු 3ක් පදනම් කර ගෙනය. එනම් එම රටවල බැංකු ඇමරිකාව සහ යුරෝපයේ සුරැකුම්කරණ වෙළඳපොළෙහි සුරැකුම්ගත බැඳුම්කරවල මුදල් ආයෝජනය කොට තිබීම නිසා අලාභ සිදුවිය.දෙවනුව එම රටවල මුදල් ආයෝජනය කොට සිදුවූ අලාභ පියවීමට මෙම රටවල ආයෝජනයන් ආපසු ගැනීමට පෙළඹින. මේ නිසා මෙම රටවල්වල දැඩි විදේශ විනිමය අර්බුදයන්ට මුහුණ දුනි. තෙවනුව සංවර්ධිත රටවල භාණ්ඩ හා සේවා ඉල්ලුම අඩුවීම හේතුකොටගෙන සංවර්ධනය වන රටවල අපනයන අඩුවීම නිසා විදේශගත විනිමය සහ දේශීය ආර්ථික කටයුතුවලට දැඩි බලපෑමක් ඇතිවිය. එමෙන්ම මෙම රටවල්වල තැනින් තැන බැංකු සහ මූල්‍ය ආයතන පිළිබඳ විශ්වාසය බිඳවැටී බැංකු අර්බුදයන් ඇතිවිය. එම නිසා මෙම රටවලද ආර්ථිකය පසුබැසීම් ඇතිවිය (සමරසිරි,2013).

ගෝලීය මූල්‍ය අර්බුදයට මහ බැංකුව විසින් විවිධ ප්‍රතිචාර දක්වා ඇත. මෙම ක්‍රියාමාර්ග තුළින් ගෝලීය මූල්‍ය පද්ධතිය බිඳවැටීම වැළැක්වීමට හැකිවූ අතර මේවායින් සමහරක් පහත පරිදි දැක්විය හැකිය. ඒ අතර කෙටිකාලීන මුදල් වෙළඳපොළ තුළ ඇතිව තිබූ පීඩනය අවම කිරීමේ අරමුණින් විශාල වශයෙන් ද්‍රවශීලතාවක් සැපයීම ඉලක්ක කරගත් ක්‍රියාමාර්ග වේ. කෙටිකාලීන වෙළඳපොළවක් වෙත පැතිරී ගිය දෙනව අවස්ථාව තුළ මහ බැංකුව විසින් වෙළඳපොල සහභාගීවන්නන් වෙත අරමුදල් නිකුත් කිරීමේදි කල්පිරීමේ කාලය දීර්ඝ කිරීම, ප්‍රතිපාර්ශව කරුවන් හා ඇප ලෙස භාරගතහැකි උපකරණ පරාසය වඩා පුළුල් කිරීම යනාදී ක්‍රියාමාර්ග යොදා ගනිමින් ද්‍රවශීලතාවක් සැපයූ අතර පුළුල් මූල්‍ය වෙළඳපොලවල් තුළ පැවති ද්‍රවශීලතා පීඩන ලිහිල් කිරීමට පියවර ගන්නා ලදී (මහ බැංකුව,2009).

2007 අගෝස්තු මාසයේදී ආරම්භ වූ ගෝලීය මූල්‍ය අර්බුදයේ මුල් අවස්ථාවන්හි දියුණු රටවල අන්තර් බැංකු ණය සැපයීම් බොහෝ දුරට අඩුවීමට ප්‍රතිචාරයක් ලෙස මහ බැංකු මැදිහත්වීම සිදුකරනු ලැබීය. එලෙසම මහ බැංකුව විසින් වඩා සාම්ප්‍රදායික මුදල් ප්‍රතිපත්ති ක්‍රියාකාරකම් මත ප්‍රතිපත්ති පොළී අනුපාතික අඩුකිරීම වැනි ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. ගෝලීය මූල්‍ය අර්බුදය දෙනව සසරට එළඹෙන විට මූල්‍ය පද්ධති ස්ථායීතාව ඇති කිරීම මහ බැංකුව විසින් සාම්ප්‍රදායික නොවන ප්‍රතිපත්තීන් ක්‍රියාවට නංවනු ලැබීය. 2008 වසර තුළ ගෝලීය මූල්‍ය අර්බුදය හමුවේ මහ බැංකුව ගත් ක්‍රියාමාර්ගවල වැදගත් ලක්ෂණය වන්නේ ලොව ප්‍රධාන බැංකු තම ප්‍රතිපත්තීන් සම්බන්ධීකරණය කරමින් ක්‍රීඩාවට නැංවීමයි. ඒ වගේම මහ බැංකුව විසින් බැංකුනොවන අංශයේ ණය තත්ත්වයන් ලිහිල් කිරීමට ගත් ක්‍රියාමාර්ග මෙහිදී වැදගත් වේ (මහ බැංකුව, 2009). මේ ආකාරයට ගෝලීය මූල්‍ය අර්බුදයට මහ බැංකුව විසඳුම් සැපයූයේ මේ ආකාරයටයි. කෙසේ වෙතත් විදේශීය රටවල්වලට මෙම මූල්‍ය අර්බුදයේ බලපෑම ඇතිවූ නමුත් ශ්‍රී ලංකාවට එතරම් බලපෑමක් ඇතිවූයේ නැත. මන්ද ශ්‍රී ලංකාවේ බැංකු මහා පරිමාණ ව්‍යාපෘතිවල එතරම් ආයෝජනය කර නොතිබීම එයට හේතුවයි.

1994 සිට 2014 දක්වා සාර්ව ආර්ථික ප්‍රතපත්ති පිළිබඳව විග්‍රහ කිරීමේදී ඒ අතර කාල සීමාවතුළ ඇතිවූ ගෝලීය ආහාර අර්බුධය සහ බල ශක්ති අර්බුදය විශාල ලෙස සාර්ව

ආර්ථිකයට බලපෑම් කර ඇත. එවන් ගෝලීය තත්ත්වයන් තුළ ශ්‍රී ලංකාව එයට මුහුණ දුන් ආකාරය, අනුගමනය කළ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග මොනවාද යන්න විමසා බැලීම වැදගත් වේ.

**ගෝලීය ආහාර අර්බුදය**

සමස්ථ ලෝකයම බලාපොරොත්තු රහිත ආහාර අර්බුදයකට 2007 වර්ෂය අවසාන භාගයේ දී සහ 2008 වර්ෂයේදී මුල් භාගයේදී ගොදුරු විය. ලෝකයේ පවත්නා ආහාර තොග සීඝ්‍රයෙන් පහත වැටුණි. ආහාර මිල ගණන් වැඩි විය. මෙම වැඩිවීම ධාන්‍ය වර්ගවලට විශේෂයෙනුත්, අනෙකුත් ආහාර භෝගවලට එහා අඩුවෙනුත් බලපාන ලදී. බොහෝ දෙනෙක් මෙම අර්බුදයට හේතු වශයෙන් දක්වන්නේ සීඝ්‍රයෙන් ඉහළ ගිය ඉන්ධන මිල ගණන්, ජීව ඉන්ධන නිෂ්පාදනය සහ අයහපත් දේශගුණික තත්ත්වය නිසා ඕස්ට්‍රේලියාව වැනි රටවල තිබූ වගා පාළුවයි. එහෙත් විශ්ලේෂකයන් පෙන්වා දෙන පරිදි මෙම අර්බුදය පිළිබඳ පෙර ලකුණු දීර්ඝ කාලයක සිට පැවතුනි. එනම් ගෝලය උණුසුම් වීම, ආහාර පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා අඩුවෙන් ආයෝජනය කිරීම, ඵලදායීතාව අඩුවීම, ලෝක ජනගහනයේ වර්ධනය හා විශාල ආර්ථිකවල විශාල පරිභෝජන රටාව වෙනස් වීමයි (ආර්ථික විමසුම-ඔක්/නොවැ.,2008). මෙම අර්බුදය සමස්ත ලෝකයාටම බලපෑම් කරන ලදී.

ඒ අතර ආර්ථික වර්ධනය මන්දගාමී වීම, දුප්පත් කම හා මන්දපෝෂණය වැඩිවීම, ආදායම් විෂමතාව වැඩිවීම, ප්‍රධාන වේ. ආහාර ආනයනය වැඩි රටවලට හා ආහාර නිපදවන්නන් නොමැති නාගරික ජනතාවට මෙම බලපෑම් වැඩියෙන් දැනෙනු ඇත. රටවල් කිහිපයක් මෙයට කෙටි කාලීන විසඳුම් ලෙස මිල පාලනය, අපනයනයන් සීමා කිරීම, ආහාර හා නිෂ්පාදනය යෙදවුම් සඳහා සහනයක් සැලසීම කර ඇත. ඒවා දැඩි ලෙස රාජ්‍ය මූල්‍යයට බලපාන සහනයන්ය. එමෙන්ම ආහාර නිෂ්පාදන වර්ධනය කිරීම දුර්වල කරන බලපෑමය. ගෝලීය ආහාර අර්බුදය සාර්ව ආර්ථිකයටද බාධා පමුණුවනු ලබයි. ඉහළ නගින ආහාර මිල නිසා පහත වැටෙමින් තිබෙන ආහාර තොග තත්ත්වයන් නිසාත් ස්වකීය රටවල දුප්පතුන්ට හා පීඩිතයන්ට අවශ්‍ය ආහාර සැපයීම පිළිබඳව ආසියා පැසිපික් රටවල ආණ්ඩුවට දැඩි පීඩනයකට මුහුණපෑමට සිදුවිය. මේ හේතුව නිසා ආසියා පැසිපික් කලාපයේ රටවල බිලියනයකට වඩා ජනගහනයන්ට ආහාර මිල ඉහළ යාම නිසා දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවිය. මොවුන්ගේ සම්පූර්ණ වියදමෙන් 60% ක් වැය වනුයේ ආහාර මිලදී ගැනීම සඳහාය. ආහාර හා බල ශක්තිය සඳහා වැයවන මුදල 75% ඉක්මවනු ලබයි. කෙසේ වෙතත් මෙහි බලපෑම් සාර්ක් කලාපීය රටවල්වලට බලපා ඇති ආකාරය විමසා බැලිය හැක.

ඇෆ්ගනිස්ථානය වැනි රටවල ආහාර මිල ඉහළ යාම නිසා උද්ධමනය 17% ක් දක්වා නැග ඇත. බංගලාදේශයට මෙය බලපා ඇත්තේ ගංවතුර හා සුළි සුළංවලට හසුවන ප්‍රදේශවලට මෙය බලපා ඇත. එම ප්‍රදේශවල මන්දපෝෂණය වැඩිවීමට මෙම ආහාර අර්බුදය හේතුවක් වී ඇත. මාලදිවයින දෙස අවධානය යොමු කිරීමේදී දැඩි ලෙස ආනයනය මත යැපීම නිසාත්, කෘෂිකාර්මික කටයුතු සීමිත වීම නිසාත් මාලදිවයින් වැසියන්ට ආහාර අනාරක්ෂිතතාවට මුහුණදීමට සිදුවිය. සාර්ක් කලාපයේ අනෙකුත් රටවල්වලටද විවිධ

බලපෑම් මේ තුළින් ඇතිවී ඇත. ශ්‍රී ලංකාව පිළිබඳ අවධානය යොමු කිරීමේදී එවකට රට තුළ පැවති යුද්ධය නිසාත් නිරන්තරයෙන් ඇතිවූ ජල ගැලීම්, නියඟයන් සහ නායයාම් නිසාත් ආහාර හිඟය දිනෙන් දින වර්ධනය විය. උද්ධමනය 34% දක්වා වැඩි විය. සහල් මිල ගණන් ඉහළ යාම උද්ධමනයට හේතු විය. වෙළඳුන් කෘත්‍රීම ලෙස සහල් මිල ගණන් වැඩි කිරීමට ගත් උත්සාහය වළකනු පිණිස 2008 මාර්තු මස රජය විසින් සහල් ආනයනය කිරීමේදී අය කරන ලද තීරුබදු ඉවත් කරන ලදී. මියන්මාරය ඉන්දියාව හා පකිස්ථානය ශ්‍රී ලංකාවට සහල් සැපයීමට පොරොන්දු විය (ආර්ථික විමසුම-ඔක්/නොවැ., 2008).

ආහාර අර්බුදයට මුහුණදීමට සාර්ක් සමුළුව හා රෝම සමුළුව විවිධ ක්‍රියා මාර්ග ගෙන ඇත. අහාර සුරක්ෂිතතාව ඇති කිරීම හා දිළිඳුකම සමනය කිරීම මෙම රටවල සංවර්ධන ප්‍රතිපත්ති සැකසීමේදී අවධානය යොමු කළ ප්‍රධාන කරුණු 2කි. මේ සඳහා විසඳුම් සෙවීමට එක් එක් රටවල සීමිත වූ පුද්ගලික ප්‍රතිපත්තිවලට අමතරව 1985 සාර්ක් සමුළුව පිහිටුවීමෙන් මේ සඳහා කලාපයට පොදු වූ ප්‍රතිපත්ති හා උපාය මාර්ගයන් සකස් කිරීම සාර්ක් සමුළුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් වූ මතෘකාවක් වේ. කෙසේ වෙතත් දීර්ඝ කාලීන වශයෙන් ආහාර සුරක්ෂිතතාව ඇතිකර ගැනීම සඳහා 15 වැනි සාර්ක් නායක සමුළුව මගින් ඇතිකරගත් ඉලක්ක ලෙස ජාතික මට්ටමෙන් පර්යේෂණ කටයුතු, ව්‍යාප්ත කටයුතු ග්‍රාමීය යටිතල පහසුකම්, යෙදවුම් ආධාර හා මූල්‍ය දිරිගැන්වීම් සඳහා ආයෝජනයන් වැඩි කිරීමේ ප්‍රතිපත්ති තීරණයන් ගැනීම ආදිය සිදුකළ යුතු බව දක්වා ඇත. 2008 අගෝස්තු මස සාර්ක් නායක සමුළුවේ දැක්ම වූයේ දකුණු ආසියාව නැවතත් ලෝකයේ ධාන්‍යාගාරය කිරීමයි.

**බලශක්ති අර්බුදය සහ ඒ සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග**

තෙල් සම්පත සීඝ්‍රයෙන් අඩුවෙමින් පවතිනබව 1970 දශකයේ සිටම අසන්නට ලැබේ. විටින් විට තෙල් මිල සහ ගෑස් මිල උච්ඡාවචනය වේ. ඒ අනුව ප්‍රවාහන මිල ගණන් ගෘහස්ථ විදුලිය, ජල බිල්පත්ද ඉහළ යනු ලබයි. ඒ නිසාවෙන් එළවළු මිල, ආහාර සහ කෘෂිකාර්මික බිම් සැකසීමේ ක්‍රම පවා ඉහළ යනු ලබයි. එබැවින් ගෝලීය බලශක්ති අර්බුදය හා ජීවන රටාව එකිනෙකට බැඳී පවතී (ආර්ථික විමසුම-දෙසැ., 2008). තෙල් මිල ඉහළ යාම බොහෝ රටවල විශේෂයෙන්ම නැගීගෙන එන සහ සංවර්ධනය වෙමින් පවතින රටවල සාර්ව ආර්ථික ස්ථායීතාවට අවධානමක් ඇති ආකාරයක් පෙන්නුම් කරමින් ගෝලීය ආකූලතාවක් ඇති වී තිබේ. මෙම සාර්ව ආර්ථික සංසටකයන්ට වෙළඳ හා ගෙවුම් ශේෂ නියමයන්, රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වයන් සහ විශේෂයෙන්ම උද්ධමනයේ අහිතකර බලපෑම් ඇතුළත් වේ. මෑත අතීතයේ ජාත්‍යන්තර තෙල් මිලෙහි ඇතිවූ ක්ෂණික හා සීඝ්‍ර ඉහළ යාම මගින් ඉතා අහිතකර ලෙස පහර වැදුනු රටවල් අතරින් ශ්‍රී ලංකාව එක් රටකි. 1973 වර්ෂයේ පළමුවන කැළඹීම හා 1979/1980 දෙවන කැළඹීමට පසු තෙල් නිසා ඇතිවූ තෙවන කැළඹීම 2005 වර්ෂයේ ඇතිවිය.

කැළඹීමෙන් පසු ලොව පුරා බොහෝ රටවල් තෙල් සඳහා ඉල්ලුම මැඩලීමට කටයුතු කරමින් හා විකල්ප බල ශක්ති ප්‍රභවයන් අපේක්ෂා කළහ. 2005-.2007 කාලය තුළ සාමාන්‍ය තෙල් මිල ගණන් 60%කින් ඉහළ ගිය අතර 2005 අවසානයේ සිට 2008 ජූලි දක්වා වර්ධනය

ආසන්න ලෙස 130% ක් විය. තෙල් මිල ඉහළ යාම ඉල්ලුම හා සැපයුම යන දෙපාර්ශවයේම සාධකයන් නිසා සිදුවිය (ආර්ථික විමසුම-දෙසැ., 2008). බොහෝ සංවර්ධනය වෙමින් පවත්නා සහ නැගීගෙන එන රටවල්වල ආසියාවේ පාවෙන ආර්ථික ක්‍රියාකාරීත්වය මගින් ඉල්ලුම් පාර්ශවයෙන් තෙල් මිල වැඩි විය. තෙල් සැපයුමේ වර්ධන වේගය අඩු වීම අඛණ්ඩව පැවතීම තෙල් මිල වැඩිවීමට සැලකිය යුතු ලෙස දායක වී ඇත. ඉල්ලුමේ වැඩිවීම හා සැපයුම් සම්බන්ධතාවන් හැරුණු විට කම්කරු වැඩ වර්ජන, තෙල් අට්ටාලයන්ට සැඩ සුළං තර්ජන, තෙල් පිරි පහදු කර්මාන්තශාලා තුළ ගිනි ගැනීම් හා ත්‍රස්තවාදී තර්ජන හා භූ දේශපාලන ආතතීන් වැනි වෙනත් ගැටළු ද තෙල් මිල කෙරේ කිසියම් බලපෑමක් ඇතිකරනු ලැබීය.

### ඛණිජතෙල් මිල පිළිබඳ ද්විත්ව කම්පනයෙහි බලපෑම්

වෙළඳ හා ගෙවුම් ශේෂ කොන්දේසි, රාජ්‍ය මූල්‍ය තත්වයන් සහ ප්‍රධාන වශයෙන් උද්ධමනය කෙරෙහි ඇතිවූ අහිතකර බලපෑම් ඇතුළුව බරපතල සාර්ව ආර්ථක බලපෑම් ඉහළ ආහාර හා තෙල්මිල මගින් රටවල් තුළ ඇති කරයි (ආර්ථික විමසුම-දෙසැ.,2008). මේ මගින් ජංගම ගිණුම ගෙවුම් ශේෂය, සංචිත වඩාත් නරක අතට පත්වියහැකි අතර විනිමය අනුපාත පීඩනයට පත්කළ හැකිය. ආහාර මිල ඉහළයාමට වඩා වැඩි ගෙවුම් ශේෂ බලපෑමක් තෙල් මිල ඉහළ යාමෙන් ඇතිවේ. සැලකිය යුතු ලෙස ආහාර හා තෙල් මිල වැඩිවීම නිසැකවම සමාජයක පහසුවෙන් අවධානමට භාජනය විය හැකි අඩු ආදායම් කණ්ඩායම්වලට බලපාන බැවින් මිල ගණන් වැඩිවීම ජනතාවගේ දරිද්‍රතා මට්ටම කෙරේ බරපතල බලපෑමක් ඇතිකරනු ලබයි.

මෙම තත්ත්වයට මුහුණදීම එනම් බලශක්තිය පිළිබඳ ගැටලුවට මුහුණදීම සඳහා විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කරනු ලබයි. ඒ අතර බල ශක්ති සංරක්ෂණය හා කාර්යක්ෂම උපකරණ භාවිතය, විකල්ප බලශක්ති මාර්ග සංවර්ධනය වැදගත් වේ. දැනටමත් සුනිත්‍ය බලශක්ති ආයතනය බලශක්ති සංවර්ධනය සඳහා මහගු කාර්යයක් ඉටු කරනු ලබයි (ආර්ථික විමසුම-දෙසැ., 2008).

### නිගමනය

දශක දෙකක් තුළ ක්‍රියාත්මක කළ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ඇතැම් අවස්ථාවන්වල රටට ගැලපෙන ප්‍රතිපත්ති ද තවත් අවස්ථාවක රටට නොගැලපෙන ප්‍රතිපත්තීන් ද ක්‍රියාත්මක කර ඇත. උදාහරණයක් වශයෙන් නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදයේදී අනුගමනය කළ ක්‍රියා මාර්ග හේතුවෙන් එයින් ඇතිවූ දරුණු බලපෑම්වලට ශ්‍රී ලංකාව හසු නොවුණි. ඒ රට තුළ ක්‍රියාත්මක වූ උචිත ප්‍රතිපත්ති නිසාය. රටක් තුළ ක්‍රියාත්මක කරන ප්‍රතිපත්තීන් වඩා හොඳ වුවත් එය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමේදී ඇතිවන දුර්වලතා නිසාවෙන් ප්‍රතිපත්ති අසාර්ථක විය හැකිය. මන්ද ඇගයීමේ කාලසීමාව තුළ ක්‍රියාත්මක කළ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති නිසියාකාරව ක්‍රියාත්මක වූයේ නම් ශ්‍රී ලංකාව ද අද සංවර්ධිත රටකි.

කලින් කලට සිදුවන දේශපාලන වෙනස්වීම් සමග සාර්ව ආර්ථික ප්‍රතිපත්තීන් ද වෙනස් වීමකට භාජනය වේ. එවිට සිදුවන්නේ එක් කණ්ඩායමක් ක්‍රියාත්මක කළ ප්‍රතිපත්තීන් පසෙක දමා පැමිණි නව කණ්ඩායම මගින් නව ප්‍රතිපත්තීන් හඳුන්වා දීමයි. එය නැවත පටන් ගැනීමකි. මෙයින් පීඩාවට පත් වන්නේ රට වැසියාය. එයට ක්‍රියාත්මක කළ යුතු හොඳම විසඳුම වන්නේ රටට උචිත ප්‍රතිපත්තීන් සකසා දේශපාලන වෙනස්වීම් ඇති වුවත් ප්‍රතිපත්තීන් ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන යාමයි. මේ තුළින් කිසිඳු අහිතකර බලපෑමක් ඇතිවනනේ නැත. උදාහරණයක් ලෙස හිටපු ජනපති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රතිපත්ති අනුව පසුගිය කාලසීමාව තුළ රටේ විවිධ සංවර්ධන ක්‍රියාදාමයන් සිදු විය. අධිවේගී මාර්ග, දිළිඳු ජනයා ඉලක්ක කර ගනු ලැබූ වැඩසටහන්, ඉදිකිරීම්, වාරි මාර්ග යෝජනා ක්‍රම ක්‍රියාවට නංවන ලදී. නමුත් දේශපාලන පක්ෂ වෙනස්වීමත් සමග වර්තමානයේ එම ක්‍රමවේදයෙන් බැහැර වී නව සැලසුම් ක්‍රියාවට නංවනු ලබයි. මෙය ප්‍රායෝගිකත්වයෙන් බැහැර වේ. එනම් රටක ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේදී එම ප්‍රතිපත්තිවල අඛණ්ඩතාවක් පැතිය යුතුය. එවිට කුමනාකාරයේ අර්බුද පැමිණියත් සාර්ථක ප්‍රතිපත්ති හමුවේ සාර්ථක ලෙස ඒවාට මුහුණදිය හැකිවනු ඇත.

**ආශ්‍රිත මූලාශ්‍රය**

*මහජන බැංකුව අගෝස්තු/ඔක්තෝබර් ආර්ථික විමසුම* (1999), මහජන බැංකුව, කොළඹ

*මහජන බැංකුව අප්‍රියෙල්/ජූලි ආර්ථික විමසුම* (2005), මහජන බැංකුව, කොළඹ.

*මහජන බැංකුව දෙසැම්බර් ආර්ථික විමසුම* (2008), මහජන බැංකුව, කොළඹ.

*මහජන බැංකුව ඔක්තෝබර්/නොවැම්බර් ආර්ථික විමසුම* (2008), මහජන බැංකුව, කොළඹ.

*මහජන බැංකුව දෙසැම්බර්/ජනවාරි ආර්ථික විමසුම* (2009/2010), මහජන බැංකුව, කොළඹ.

*මහජන බැංකුව ජනවාරි, ආර්ථික විමසුම* (2010), මහජන බැංකුව, කොළඹ.

*මහජන බැංකුව පෙබරවාරි/මාර්තු, ආර්ථික විමසුම* (2010), මහජන බැංකුව, කොළඹ.

*මහජන බැංකුව දෙසැම්බර්/ජනවාරි, ආර්ථික විමසුම* (2012/2013), මහජන බැංකුව, කොළඹ.

*මහජන බැංකුව පෙබරවාරි/මාර්තු ආර්ථික විමසුම* (2013), මහජන බැංකුව, කොළඹ

*මහ බැංකු වාර්ෂික වාර්තාව* (2002), ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

*මහ බැංකු වාර්ෂික වාර්තාව* (2005), ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

මහ බැංකු වාර්ෂික වාර්තාව (2009), ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

*මහ බැංකු වාර්ෂික වාර්තාව* (2010), ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

*මහ බැංකු වාර්ෂික වාර්තාව* (2011), ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

*මහ බැංකු වාර්ෂික වාර්තාව* (2012), ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

*මහ බැංකු වාර්ෂික වාර්තාව* (2013), ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

සමරසිරි. පී. (2013), *ආර්ථිකවිද්‍යා මූලධර්ම හා ප්‍රතිපත්ති*, ශ්‍රී ලංකා මහබැංකුව මුද්‍රණාලය, කොළඹ.

http://www.aph.gov.au/Library/plus/BriefingBook 44p/Macro Economic Policy

http://en.wikipedia.org.